# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2024.06.12 |

**ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ නියාමන සහ අධීක්ෂණ අධිකාරිය ලෙස කටයුතු ආරම්භ කිරීම**

දැනට ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීම සඳහා, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන වැනි මුදල් පැවරීම් සේවා සපයන ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව හෝ අදාළ වෙනත් අධිකාරී ආයතන විසින් නියාමනය කරනු ලැබේ. කෙසේ වෙතත්, ඒ හා සමාන සේවා සපයන සමහර ආයතන මුදල් පැවරීම් පද්ධතියට බාධා එල්ල විය හැකි අයුරින්ද මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම (Anti-Money Laundering/Countering of Financing of Terrorism) පිළිබඳ වූ නියාමන රාමුවට යටත් නොවෙමින්ද විධිමත් පද්ධතියෙන් පරිබාහිරව ක්‍රියාත්මක වේ.

මෙයට විසඳුමක් ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2005 අංක 28 දරන ගෙවීම් සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ 2024 අප්‍රේල් 20 දිනැති 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා (Money or Value Transfer Service) සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, 2024 ජූනි 3 දින සිට බලපැවැත්වෙන පරිදි, මෙම නියෝග වලට අනුව සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් ලියාපදිංචි වීම සහ අධීක්ෂණයට යටත් වීම සිදු විය යුතු අතර එමගින් ලියාපදිංචි නොකළ හෝ බලපත්‍ර නොමැති සේවා සපයන්නන් හට ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු විධිමත් කිරීමටත්, විධිමත් මාර්ග හරහා මුදල් පැවරීම් සේවා ව්‍යාපාරයේ නිරත වීමටත් අවස්ථාව සලසනු ලබයි.

මෙම නියෝගයන්හි දක්වා ඇති අරමුණු සඳහා "මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා" යන්නෙන් මුදල්, චෙක්පත්, වෙනත් මූල්‍ය උපකරණ හෝ අනෙකුත් අගය රාශිගත උපකරණ ආකාරයෙන් මුදල් භාර ගැනීම සහ එම වටිනාකමට අනුරූප අගයක් මුදලින් හෝ සන්නිවේදනය, පණිවිඩය, පැවරීම මඟින් ප්‍රතිලාභියෙකුට ගෙවීම හෝ ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන්නා අයත් වන නිෂ්කාශන ජාලය ආදී වෙනත් ක්‍රමවේද මඟින් ප්‍රතිලාභියෙකුට ගෙවීම් කිරීම යන මූල්‍ය සේවාවන් අදහස් වේ. එවැනි ගනුදෙනු සඳහා අතරමැදියකු හෝ වැඩි ගණනක් සම්බන්ධ වීමට හැකි අතර තෙවන පාර්ශවයකට සිදු කරන අවසාන ගෙවීමක් ද ඇතුලත් විය හැකිය. එසේම, එවැනි ගනුදෙනු ශ්‍රී ලංකාව තුල එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයකට හෝ වෙනත් යම් රටක සිට ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකාවේ සිට වෙනත් රටකට විය හැකිය.

මෙම නියෝග අනුව, යම් පුද්ගලයෙක් මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතු වල නිරත වීම හෝ ක්‍රියා කිරීම සිදු කළ යුතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක අධිකාරිය යටතේ සහ එහි අන්තර්ගත නියමයන් හා කොන්දේසි වලට අනුකූලව පමණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් නියාමකයෙකු හෝ රාජ්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද වෙනත් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ බලය පැවරීමක් යටතේ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස දැනටමත් ක්‍රියා කරන හෝ එසේ නිරත වීමට හෝ ක්‍රියාකිරීමට සුදුසුකම් ඇති ඕනෑම පුද්ගලයෙකු ඉහත සඳහන් නියෝගයන්හි විධිවිධාන වලින් නිදහස් කර ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් නියාමකයෙකු හෝ රාජ්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ බලය පැවරීමක් නොමැතිව මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස

දැනටමත් සේවා සපයන පුද්ගලයන් මෙම නියෝග බලාත්මක වූ දින, එනම්, 2024 ජුනි මස 3 වන දින සිට වසරක් ඇතුළත ලියාපදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් කළ යුතු වේ.

මෙම නියෝග යටතේ, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතු වල නිරත වීම හෝ ක්‍රියා කිරීම සඳහා පුද්ගලයෙකු සපුරා තිබිය යුතු ප්‍රධාන අවශ්‍යතා පහත පරිදි වේ.

(අ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති අවම වශයෙන් රුපියල් මිලියන විස්ස (20) ක හෝ මහ බැංකුව විසින් නියම කරන ලද වෙනත් ප්‍රමාණයක, ක්ෂය නොවූ ප්‍රාග්ධනයක් ඇති සමාගමක් විම.
2007 අංක 7 දරන සමාගම් පනතෙහි අර්ථ නිරූපණය අනුව, ඇපයෙන් සීමිත සමාගමක්, අක් වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් මෙම නියෝග යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් නොලබයි.

(ආ) මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකුගේ ව්‍යාපාර හා කටයුතු පමණක් සිදු කිරීම.

(ඇ) මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයීම සඳහා පද්ධතියක් හෝ මනාව සකසන ලද යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම/ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකුගේ ව්‍යාපාරයේ නියැලීමට අපේක්ෂා කරන සුදුසුකම් ලත් පුද්ගලයෙකු, නියම කර ඇති අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කර ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතුය. එලෙස නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක් සතු සමාගමක් "ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු" ලෙස හඳුන්වනු ලබන අතර ඉහත අර්ථ දක්වා ඇති පරිදි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතු වල නිරත වීමට හෝ ක්‍රියා කිරීමට හිමිකම් ලබයි. තවද, මෙම ව්‍යාපාර ක්‍රියාවලියේදී, ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයන් අතර මුදල් සම්ප්‍රේෂණය බැංකු හුවමාරු මාර්ගයෙන් සිදු කළ යුතුය. තවද, ඔවුන් විසින් නියෝජිතයින්, ආශ්‍රිතයන්, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලෙන සේවකයින්, සහ ප්‍රේෂකයා, ප්‍රතිලාභියා, නියෝජිතයා, හුවමාරු කිරීමේ ක්‍රමය, සුරක්ෂිතව තබා ගත යුතු කාලය ආදී තොරතුරු ද ඇතුළත්ව ගනුදෙනු පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ නියාමන සහ අධීක්ෂණ අධිකාරිය ලෙස ක්‍රියා කරනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව හට ඕනෑම ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකුම අධීක්‍ෂණය කිරීම සිදු කළ හැකි අතර, එවැනි ඕනෑම ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු හෝ කිහිපදෙනෙකු වෙත ඔවුන්ගේ ව්‍යාපාරයේ ඕනෑම අංගයක කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් වූ නියමයන් නිකුත් කළ හැකිය.

දැනටමත් මෙම නියෝග වලට යටත් වන හෝ එසේ යටත් වීමට හැකියාවක් පවතින සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකුම නියමිත කාලසීමාව ඇතුළත මෙම නියෝග වලට අනුකූල වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. ඉහත සඳහන් නියෝග වෙත: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/psd_reg_2024__1_s.pdf යන සබැඳිය හරහා ප්‍රවේශ විය හැකිය.

වැඩිදුර තොරතුරු ලබා ගැනීම පිණිස, 011 2477642 යන දුරකථන අංකය හෝ mvts@cbsl.lk යන විද්‍යුත් තැපැල ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැක.